**ශීර්ෂය 08 - ජාතික පොලිස් කොමිෂන් සභාව**

---------------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

ශීර්ෂය 08 - ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 23 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික පොලිස් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී .ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථීක තීරණ කෙරෙහි වන බලපෑම මත රදා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි දැනුවත් කරමි.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**2. මූල්‍ය සමාලෝචනය**

**-------------------------**

**2.1 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

**----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනයේ 2022 දෙසැම්බර් 31 දිනට රු.20,916 ක් වූ බැඳීම් හා බැරකම් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී දෙසැම්බර් මසට අදාළ වවුචර් නියමිත කාලවකවානුව තුළ බැරකම් ලේඛනයට ඇතුළත්කිරීමට නිළධාරීන් දැනුවත් කිරීමට කටයුතු කළ බව දන්වා ඇත. | රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**-------------------------------**

**3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ) 2020 හා ඊට පෙර වර්ෂවලදී සියයට 70 ඉක්ම වූ පැමිණිලි විභාග කිරීමේ, ප්‍රගතියක් පැවතියද, 2022 දෙසැම්බර් 31 දිනට ලද පැමිණිලි විමර්ශන අවසන් කිරීමේ ප්‍රගතිය සියයට 27 ක් විය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විමර්ශන අවසන් කිරීමේ අඩුම ප්‍රගතිය සියයට 7 ක් උතුරු | වසරේ මුල සිට රටෙහි පැවති අර්බුධකාරී තත්ත්වය මත රා.පරි. චක්‍රලේඛ අනුව නිලධාරීන් සේවයට කැඳවීම සීමා කර තිබීම, ප්‍රවාහන අපහසුතා තිබීම, නිවසේ සිට ලිපිගොනුවල රාජකාරී සිදුකළ ද අවශ්‍ය වාර්තා, ලිපි ආදිය මුද්‍රණය කිරීමට අවශ්‍ය පරිගණක පහසුකම් නොමැති නිසා ඒ සඳහා කාර්යාලයට පැමිණිය යුතුවීම, | මහජන පැමිණිලි විභාග කිරීම ප්‍රශස්ථ මට්ටමට පත්කරගත යුතු වීම. |

| | | |
|---|---|---|
| පළාතේ ද සියයට 16 ක් මධ්‍යම පළාතේද විය. | මධ්‍යම පළාත් කාර්යාලයේ පමණක් සියලුම විමර්ශන කටයුතු සිදුකිරීමට එක් විමර්ශන නිලධාරියෙකු පමණක් සිටින බව දන්වා තිබුණි. | |
| (ආ) බස්නාහිර I, II, දකුණ හා වයඹ යන පළාත් සඳහා වැඩිම පැමිණිලි සංඛ්‍යාවක් වන මුළු පැමිණිලිවලින් සියයට 21 ක් 18 ක් 15 ක් හා 10 ක් ලෙස ලැබී තිබුණු අතර, විමර්ශනය අවසන් කළ ප්‍රගතිය සියයට 27 ක් 31 ක් 29 ක් හා 27 ක තරම් අඩු මට්ටමක පැවතුණි. | බස්නාහිර පළාත් 1 හා 11 කාර්යාලයලට ලැබෙන පැමිණිලි ප්‍රමාණය අනුව එහි රාජකාරී කටයුතු කිරීමට සිටින නිලධාරීන් ප්‍රමාණවත් නොවන බව දන්වා තිබුණි. | පළාත් කාර්යාලවල මහජන පැමිණිලි විභාග කිරීම ප්‍රශස්ථ මට්ටමට පත් කර ගත යුතු වීම. |
| (ඇ)පැමිණිලි ස්වභාවය අනුව පොලීසිය විසින් ක්‍රියා නොකිරීම, බලය අයථා පරිහරණය හා පක්ෂග්‍රාහීවීම යන පැමිණිලි වැඩි ප්‍රමාණයක් ලැබී තිබුණු අතර, එය ලද මුළු පැමිණිලිවලින් සියයට 31 ක් 24 ක් හා 20 ක් විය. සමාලෝචිත වර්ෂය අවසානයේදී එම පැමිණිලි විසඳූ ප්‍රගතිය සියයට 24 ක් 23 ක් හා 22 ක් තරම් අඩු මට්ටමක විය. | පැමිණිලිකරුවන් වෙතින් වැඩිදුර තොරතුරු ලබාගැනීමට ප්‍රමාද වීම හා පොලිස් ස්ථාන වෙතින් කැඳවන උද්ධෘත සහ වාර්තාද සැමවිටම පාහේ නිසි වේලාවට නොලැබීම හා ඒවායේ අඩුපාඩු පවතින අවස්ථාද බොහෝය. මේ පිළිබඳ පොලිස්පති දැනුවත් කර ඇති බව දන්වා තිබුණි. | මහජන පැමිණිලි විභාග කිරීම ප්‍රශස්ථ මට්ටමට පත් කරගත යුතු වීම. |

**3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

**---------------------------------**

2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මුල්‍ය ප්‍රකාශ සමඟ ඉදිරිපත් කළයුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | විගණන වාර්තාවද ඇතුළත්කර පෙර වර්ෂවලදී සිදුකළ ලෙසට වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කර ඉදිරියේදී පාර්ලිමේන්තුවට සහ විගණනය වෙත ඉදිරිපත්කිරීමට කටයුතු කරනු ලබන බව දන්වා තිබුණි. | 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**3.3** **පාඩු හා හානි**

----------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රාජකාරී ජංගම දුරකථනයක් 2022 අප්‍රේල් 12 වන දින අස්ථානගත වී තිබුණි. 2022 නොවැම්බර් 18 දින මූලික විමර්ශනයේ මු.රෙ. 105 ප්‍රකාරව නැති වූ ජංගම දුරකථනයේ වර්තමාන වටිනාකම රු.71,249 ක් ලෙස හඳුනාගෙන තිබුණ ද, 2022 දෙසැම්බර් 31 දිනට එම අලාභය වාර්තා කර නොතිබුණි. | මූල්‍ය ප්‍රකාශන සකස්කරන අවස්ථාවේදී මූලික විමර්ශනය සිදුකර පැවතියද, අයකරගත යුතු මුදල සම්බන්ධයෙන් තීරණය කර නොතිබූ බැවින් ඒ සම්බන්ධයෙන් 2022 මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් නොකළ බව දක්වා තිබුණි. | මූල්‍ය ප්‍රකාශන තුළ අදාළ හානිය වාර්තා කළ යුතු වීම. |

**4.** **යහපාලනය**

----------------

**4.1** **අභ්‍යන්තර විගණනය**

---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කොමිෂම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබූ බැවින්, සමාලෝචිත වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණක තනතුර සඳහා නිලධාරියෙකු අනුයුක්ත කරන ලෙස පත්වීම් බලධාරියාගෙන් අවස්ථා ගණනාවකදී ඉල්ලුම් කළත්, නිලධාරියෙකු ලබානොදීම හේතුවෙන් අභ්‍යන්තර විගණන අංශයක ස්ථාපිත කිරීමට නොහැකි වී ඇති බව දන්වා තිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 30 න් 15 ක් හෙවත් සියයට 50 ක් පුරප්පාඩුව පැවතුණු අතර ඉන් ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ, ප්‍රධාන විමර්ශක, නීති නිලධාරී, අභ්‍යන්තර විගණක යන තනතුරු පුරප්පාඩුව පැවතුණි. මෙම තත්ත්වය පැමිණිලි හා විමර්ශන ප්‍රමාදයට ද හේතු විය හැකි බව නිරීක්ෂණය විය. | කොමිෂන් සභාවේ කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා පුරප්පාඩු පුරවන තෙක් හෝ වසරක කාලයක් සඳහා හෝ කොන්ත්‍රාත් පදනමින් බඳවාගැනීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ජනාධිපති ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් ද රාජ්‍ය සේවයේ බඳවාගැනීමේ ක්‍රියාවලිය සමාලෝචනය කිරීමේ අමාත්‍ය මණ්ඩල නිලධාරී කමිටුව වෙතින්ද අනුමැතිය ඉල්ලා ඇතත්, මෙතෙක් එම අනුමැතිය ලැබී නොමැති බව දන්වා තිබුණි. | කාර්යසාධනය ඉහළ නැංවීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතු වීම. |
| (ආ) ද්විතීක මට්ටමේ තනතුරු සියයට 34 ක් පුරප්පාඩුව පැවති අතර සංවර්ධන නිලධාරී, කළමනාකරණ සේවා නිලධාරී හා තොරතුරු තාක්ෂණ සහකාර තනතුරු පුරප්පාඩුවී පැවති අතර එය ආයතනයේ කාර්ය සාධනයට බලපා ඇති බව නිරීක්ෂණය විය. | අවස්ථා ගණනවකදී පුරප්පාඩු පුරවන ලෙස දැනුම් දී ඇතත් මේ දක්වා ප්‍රමාණවත් පරිදි නිලධාරීන් අනුයුක්ත කර නොමැති අතර කළමනාකරණ සේවා නිලධාරීන් මේ වන විට තනතුරු 12 ක් පමණක් පිරවීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි. | කාර්ය සාධනය ඉහළ නැංවීමට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුයුක්ත කළ යුතු වීම. |
| (ඇ) විශ්‍රාමික රජයේ නිලධාරීන් නැවත සේවයේ යෙදවීම සඳහා වූ 2018 පෙබරවාරි 20 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2018 හි 02 (iv) ඡේදය ප්‍රකාරව මොනම හේතුවක් නිසා හෝ වයස අවුරුදු 67 සම්පූර්ණ | බස්නාහිර පළාත සඳහා පොරොත්තු ලේඛනයේ ඉහළම ලකුණු ලබා සිටි නිලධාරියා ජාතික පොලිස් කොමිෂන් සභාවෙන් ලද අනුමැතිය මත 2022 මාර්තු 01 දින සිට ජාතික පොලිස් කොමිෂන් සභාවේ බස්නාහිර පළාත් අධ්‍යක්ෂ ලෙස වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

කළ කිසිවෙකු රාජ්‍ය සේවයේ තනතුරකට පත් නොකළ යුතු වුව ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ බස්නාහිර පලාත් අධ්‍යක්ෂ තනතුරට 2022 මාර්තු 02 දින සිට 2023 මාර්තු 01 දින දක්වා කොන්ත්‍රාත් පදමට අවු.67 සම්පූර්ණ වූ විශ්‍රාමික නිලධාරියෙකු පත්කර තිබූ අතර, මසකට රු.60,000 බැගින් අදාළ වර්ෂය සඳහා රු.720,000 ක් චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබුණි.

පදනම මත පත් කරන ලද බවත්, 3/2018 චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත්කර ඇති අතර, ඉදිරියේදී මෙවැනි තත්ත්ව ඇති නොවීමට කටයුතු කර ඇති බව දන්වා තිබුණි.